# International Tipitaka Chanting Council

Established 2006, B.E. 2550

## බුද්ධගයා 2600 සම්බුද්ධත්ව ජයන්ති ත්‍රිපිටක සජ්ඣායනා මහෝත්සවය

ජාත්‍යන්තර ත්‍රිපිටක සජ්ඣායනා සංගමයේ මූලිකත්වයෙන් වාර්ෂික ත්‍රිපිටක සජ්ඣායනාව මෙවරත් සම්භාවනීය දෙස් විදෙස් ගිහි පැවිදි අතිවිශාල පිරිසකගේ සහභාගිත්වයෙන් දෙසැම්බර් මස 02 - 12 දිනයන්හි බුද්ධගයා ශුද්ධ භූමියේ දි, 2600 සම්බුද්ධත්ව ජයන්තිය අනුස්මරණය කරමින් අත්‍යුත්කර්ෂයෙන් පැවැත්වේ.

කාම්බෝජය, බංග්ලාදේශය, ලාඕසය, ඉන්දුනීසියාව, ඉන්දියාව, නේපාලය, බුරුමය, තායිලන්තය, ශ්‍රී ලංකාව සහ වියට්නාමය ආදි රටවල් 10 කින් පමණ වැඩම කරනු ලබන අතිසම්භාවනීය මහා සංඝ රත්නය සහ විශාල දායක දායිකා පිරිසක් සහභාගිවේ. 1500 ක් පමණ වන මෙම පිරිස මිහිපිට පවත්නා අති පරිශුද්ධ පරම පූජනීය බුද්ධගයා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස දී, එදා ඇති වූ ආධ්‍යාත්මික පරිවර්තනය අනුස්මරණය කරමින් මෙම ත්‍රිපිටක දේශනාව පවත්වති. මේ පිළිබඳ අදහස් දක්වන සංගමයේ සභාපති බුරුම ජාතික ගරු යු. ඤාණින්ද හිමිපාණෝ "ශ්‍රේෂ්ඨ බුදු දහමේ මූලාරම්භය සනිටුහන් වූ ආර්යදේශ මහ පොළවේ ඉන්දීය සංස්කෘතිය අගයමින්, 2600 සම්බුද්ධත්ව ජයන්තිය සැමරීමට ලැබීම භාග්‍යයක්, වාසනාවක්" යයි පවසති.

අතිසම්භාවනීය දෙස් විදෙස් ආරාධිතයින් සහභාගි වන සමාරම්භක මහ පෙරහැර සහ උත්සවය දෙසැම්බර් 02 දින පැවැත්වෙන අතර, අනිකුත් සියලු දිනයන්හි සන්ධ්‍යාභාගයේ දි ඉංග්‍රීසි, හින්දි යන භාෂා මාධ්‍යන්ගෙන් ධර්ම දේශනා සහ සාකච්ඡා පැවැත්වීමට ද සංවිධායක මණ්ඩලය කටයුතු කර ඇත. වැඩම කරවන අතිපූජ්‍ය මහා සංඝයා වහන්සේට ආවාස පහසුකම් සකසමින් දාන මාන පිරිනමමින් අලංකාර සැරසිලි හා මල් පූජාවලින් යුක්තව මෙම මහා ත්‍රිපිටක සජ්ඣායනා පිංකම දෙසැම්බර් 02 සිට 12 දක්වා අත්‍යලංකාරයෙන් පැවැත්වේ.

ලෝ වැසි සියලු සැදැහැවතුන්ගේ සහභාගිත්වයෙන් සංවිධාන කමිටුව ගෞරවයෙන් අපේක්ෂා කරයි.

වැඩි විස්තර සඳහා

www.tipitakachanting.org

ගරු චන්දසිරි හිමි දු. ක. +91 995 581 9322

(ත්‍රිපිටක දේශනා සංගමයේ උපසභාපති)

වැන්මෝ ඩික්සි මහත්මිය දු. ක. +001 510 809 1025

(ජාත්‍යන්තතර බුද්ධ ධර්ම සංවිධානය)

හෝ

කුමාර සිරිවර්ධන මහතා දු. ක. +66 894 50 452

*P.O. Box 44 Bodhgaya, India 824231*

*www.tipitakachantingcouncil.org*